**දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය II - සංරචකය - 2016**

**--------------------------------------------------------------------------------**

දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - II සංරචකය 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 5228 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------**

මූල්‍ය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය, වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර පළාත් මට්ටමින් ව්‍යාපෘතියේ කාර්යයන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලට අනුව, 2013 සිට 2017 වර්ෂය දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහාය සැපයීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. මන්ද පෝෂණය හා බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා වඩා යහපත් ප්‍රතිචාර ඇති කිරීම සඳහා හැකිවනු පිණිස මහජන සෞඛ්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රමිතීන් ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,270 කට සමාන විගැහි (SDR) මිලියන 129.8 ක් (එජඩො මිලියන 200 ක්) වන අතර ඉන් රු.මිලියන 1,263.5 කට සමාන විගැහි මිලියන 6.5 ක් (එජඩො මිලියන 10 ක්) ව්‍යාපෘතියේ II - සංරචකය යටතේ සිදු කළ යුතු කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘති කාර්යයන් 2013 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය. මෙම වාර්තාව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් සිදු කරන ලද කාර්යයන් හා වෙනම ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතියේ II - සංරචකය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් වලින් සමන්විත වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථකිරීම සඳහා ඉදිරිපත් කර ඇති වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඔ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථකිරීම සඳහා ඉදිරිපත් කර ඇති වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------

#### 2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල විශේෂ ඩොලර් ගිණුම යටතේ මුදල් හුවමාරු කිරීමේ ලැබීම් ලෙස රු.619,977 ක් පෙන්වා තිබූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් හුවමාරු වාර්තාවලට අනුව එය රු.764,833 ක් විය. ගණනය කිරීමේ දෝෂයක් මෙයට හේතු වී තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

ව්‍යාපෘතිය මඟින් පවත්වනු ලබන වාර්තා අනුව, අරමුදල් මූලායනය, අයවැයගත වෙන්කිරීම හා සමාලෝචිත වර්ෂය සඳහා සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2016** දෙසැම්බර් **31** දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං සංරචකය - II | 10 | 1,263.50 | 325.5 | 02.28 | 317.53 | 2.59 | 356.46 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ඉහත තොරතුරුවලට අනුව ව්‍යාපෘතියක වෙන්කරන ලද එජඩො මිලියන 10 කට සමාන රු.මිලියන 1263.5 කින් එජඩො මිලියන 2.59 කට සමාන රු.මිලියන 356.46 ක් හෙවත් සම්පූර්ණ වෙන්කිරීම්වලින් සියයට 28.21 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුනේ අවුරුදු 3 ක කාල පමාවකින් යුක්තවය. එම නිසා අවුරුදු 2 ක ඉතිරි ව්‍යාපෘති කාලය තුළ සම්පූර්ණ ප්‍රතිපාදනය භාවිතා කිරීමේ හැකියාව සැක සහිතය.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය යටතේ ඉටුකර ගත යුතු භෞතික ඉලක්ක, නවෝත්පාදන, ප්‍රතිඵල නියාමන හා ඉලක්ක ධාරිතා ගොඩනැගීම නම් වූ උප සංරචක 03 ක් මත පදනම් වේ.

ඉලක්ක ඉටුකරගැනීම පිළිබඳ නිරීක්ෂණයන් පහත විස්තර කරනු ලැබේ.

(අ) සෞඛ්‍ය අංශයේ ප්‍රතිපත්ති තීරණ ගැනීමට අවශ්‍යවන දත්ත එකතු කිරීම සඳහා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ප්‍රජා විද්‍යාත්මක සෞඛ්‍ය සමීක්ෂණයක් සිදුකිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණු අතර එය 2015 ජනවාරි 01 දින සිට සති 58 කින් නිමකිරීමට අපේක්ෂා කර තිබුණි. විදේශීය උපදේශකවරුන් යෙදවීම සඳහා රු.මිලියන 44 කට සමාන එජඩො 329,783 ක් ඇතුලත්ව සමීක්ෂණයේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 189.57 ක් විය. එසේ වුවත්, සමීක්ෂණය සඳහා පරිගණක සහ වෙනත් උපකරණ ප්‍රසම්පාදනය කිරීමට රු.මිලියන 32 ක පිරිවැයක් 2016 වර්ෂයේ දරා තිබුණද සමීක්ෂණය 2017 මැයි 30 දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතිය නව සොයා ගැනීම් පර්යේෂණ 59 පිළිගන්නා ලද අතර එයින් පර්යේෂණ කාර්යයන් 20 කට අදාළ යෝජනා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 51 ක් වියදම් කරමින් 2016 දෙසැම්බර් 31 දින ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, අවුරුදු 3 කාල ප්‍රමාදයන් සහිතව වුවත් යෝජනා 19 කට අදාළ කාර්යයන් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කිරීමෙන් සම්පූර්ණ කර නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 25.30 ක් වාර්ෂික සැලැස්ම යටතේ ධාරිතා ගොඩනැගීම සඳහා දේශීය පුහුණු වැඩමුළු පැවැත්වීමට වෙන් කර තිබුණද එයින් රු.මිලියන 14.37 ක් හෙවත් සම්පූර්ණ ප්‍රතිපාදනයෙන් සියයට 56.80 ක් පමණක් උපයෝජනය කර තිබුණි. වර්ෂය

තුල ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ වැඩසටහන් 6 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විට වැඩසටහන් 2 ක් පමණක් පවත්වා තිබුණි.

### 3.3 මූල්‍ය පාලන පිළිබඳ කරුණු

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

මුදල් රෙගුලාසි 133 (2) හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව, රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන කාර්යයන් ආවරණය කර නොතිබුණි.